# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

## අධ්‍යාපනවේදී ගෞරව (විශේෂ අවශ්‍යතා අධ්‍යාපන) උපාධි වැඩසටහන 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීම

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ විශේෂ අවශ්‍යතා අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් පිරිනැමෙන අධ්‍යාපනවේදී ගෞරව (විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය) උපාධි වැඩසටහනේ තෙවන වසර (පස්වන මට්ටම) සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**ඉහත සම්පූර්ණ වැඩසටහන සඳහා ගතවන කාලය වසර හතරකි.**

| | |
|---|---|
| පළමු වසර - 3 වන මට්ටම<br>දෙවන වසර - 4 වන මට්ටම | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් මෙහෙයවන ඕනෑම ඩිප්ලෝමා වැඩසටහනක් හෝ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා වැඩසටහන - (විශේෂ අධ්‍යාපන) |
| තෙවන වසර - 5 වන මට්ටම<br>සිව්වන වසර - 6 වන මට්ටම | විශේෂ අවශ්‍යතා අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් පිරිනැමෙන විෂයයන් හැදෑරිය යුතුය. |

**තෙවන වසර (පස්වන මට්ටම) සඳහා අයදුම්පත් කැඳවීම හා සිසුන් ලියාපදිංචි කිරීම විශේෂ අවශ්‍යතා අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.**

විශේෂ අවශ්‍යතා අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවන අධ්‍යාපනවේදී ගෞරව (විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය) උපාධි වැඩසටහනේ පස්වන මට්ටම සඳහා අයදුම්පත් කැඳවනු ලබන්නේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ඕනෑම දෙපාර්තමේන්තුවක් / පීඨයක් මගින් මෙහෙයවන ඩිප්ලෝමා (3 වන මට්ටම සහ 4 වන මට්ටම) වැඩසටහන් සම්පූර්ණ කළ හෝ හෝ ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා වැඩසටහන (විශේෂ අධ්‍යාපන) සම්පූර්ණ කළ අයගෙන් පමණි.

**මාධ්‍යය** - ඉංග්‍රීසි /සිංහල /දෙමළ
**කාලය** - වසර දෙකකි
**අධ්‍යයන කටයුතු** - කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථානයෙන් පමණි.
(කෙසේ වෙතත් ඒ ඒ මාධ්‍යයන්ට ලියාපදිංචි වන ශිෂ්‍ය සංඛ්‍යාව මත වැඩසටහන පිරිනමන ඉගෙනුම් මාධ්‍යය තීරණය වේ.)

**සැ.යු. ඉදිරියේ දී අධ්‍යාපනවේදී : වී.අ.අ. (උපාධි වැඩසටහන හැදෑරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන්ට)**

අධ්‍යාපනවේදී (විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය) උපාධි වැඩසටහන හැදෑරීමට බලාපොරොත්තු වන අයදුම් කරුවෙකු කළ යුතු ප්‍රථම කාර්යය වන්නේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ඕනෑම දෙපාර්තමේන්තුවක් / පීඨයක් මගින් මෙහෙයවන ඩිප්ලෝමා වැඩසටහනක් (3 වන සහ 4 වන මට්ටම) හැදෑරීමයි. එහිදී අදාළ වැඩසටහන් තෝරා ගැනීමේදී පහත වැඩසටහන් වලින් එකකට ප්‍රමුඛතාවය ලබා දෙන්නේ නම් මැනවි.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් පිරිනමන

- මුල් ළමා විය සහ ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන (3 වන සහ 4 වන මට්ටම)
- සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධි වැඩසටහන (3 වන සහ 4 වන මට්ටම)
- කළමණාකරණ අධ්‍යයනවේදී උපාධි වැඩසටහන ( 3 වන සහ 4 වන මට්ටම)
- ස්වාභාවික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධි වැඩසටහන (3 වන සහ 4 වන මට්ටම)

උක්ත වැඩසටහනක (3 වන සහ 4 වන මට්ටම) සම්පූර්ණ කර ඇති සිසුන්ට අධ්‍යාපනවේදී ගෞරව (වී.අ.අ.) උපාධි වැඩසටහනේ අවසාන අවුරුදු දෙක සඳහා ලියාපදිංචි විය හැකිය.

**අයදුම් කිරීමේ ක්‍රියා පිළිවෙළ**

**අදාළ ඇතුලත් වීමේ සියළු සුදුසුකම් ඒ ඒ පාඨමාලාවේ ලියාපදිංචි කිරීමේ දිනය වන විට සපුරා තිබිය යුතුය.**

අයදුම්පත්‍ර ගාස්තුව - රු. 350/-

අදාළ ගෙවීම් ඔබගේ ඩෙබිට් / ක්‍රෙඩිට් බැංකු කාඩ්පත් මගින් අපගේ වෙබ් පිටුවට පිවිසීමෙන් සිදුකල හැක.
https://payment.ou.ac.lk/ ඩෙබිට්/ ක්‍රෙඩිට් කාඩ්පත් නොමැති අයදුම් කරුවන් හට අදාළ ගෙවීම් මුදල් වශයෙන් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලීය ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථානයක සිදුකල හැක.

විවෘත විශ්වවිද්‍යාලීය ප්‍රාදේශීය මධ්‍යස්ථාන වලින් එකකට පහත සඳහන් තොරතුරු සමඟ පැමිණීමෙන් අයදුම් කිරීමේ ක්‍රියාවලිය සඳහා සහයෝගය ලබාගත හැක. අවශ්‍ය තොරතුරු වනුයේ, **ජාතික හැඳුනුම්පත් අංකය, විද්‍යුත් තැපැල් ලිපිනය, ජංගම දුරකථන අංකය, සම්පූර්ණ නම**

**අයදුම්පත් බාර ගැනීම**




අයදුම් කිරීම : 2021 මාර්තු 07 සිට 2021 අප්‍රේල් 07 දක්වා
අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය : 2021 අප්‍රේල් 07
මාර්ගගත අයදුම්පත් (online application) පමණක් බාරගැනීම සිදුවේ.

අන්තර්ජාලයෙන් අයදුම් කිරීම සම්බන්ධව තොරතුරු සහ පහසුකම් ලබාගැනීම සඳහා විවෘත විශ්ව විද්‍යාලයේ ප්‍රාදේශීය සහ අධ්‍යයන මධ්‍යස්ථාන වෙත පැමිණෙන්න.

කොළඹ (නාවල), මහනුවර (පොල්ගොල්ල), මාතර (නුපේ), අනුරාධපුරය, මඩකලපුව, යාපනය, බදුල්ල, කුරුණෑගල, අම්බලන්ගොඩ, අම්පාර, බණ්ඩාරවෙල, ගාල්ල, අම්බලන්තොට, කළුතර, කෑගල්ල, පොළොන්නරුව, මොණරාගල, රත්නපුර, වවුනියාව, හැටන්, ත්‍රිකුණාමලය, කිලිනොච්චිය, මුලතිව්, ගම්පහ, පුත්තලම, කුලියාපිටිය සහ මන්නාරම.

**ලබාගත හැකි ශිෂ්‍යත්ව - මහපොල ශිෂ්‍යත්ව, විශ්වවිද්‍යාල ශිෂ්‍යාධාර, ප්‍රවර්ධන ශිෂ්‍යාධාර සහ බඳවා ගැනීමේදී දෙනු ලබන ශිෂ්‍යාධාර**
**(වැඩි විස්තර සඳහා ශිෂ්‍ය කටයුතු හා සුභසාධක අංශය අමතන්න - 0112881374)**

**වැඩිදුර විස්තර සඳහා**
මහජන සම්බන්ධතා කාර්යාලය, නාවල, නුගේගොඩ රජයේ නිවාඩු දිනවල හැර අනෙකුත් ඕනෑම දිනවල උදේ 9. 00 සිට සවස 3. 00 දක්වා අනෙකුත් ඕනෑම මධ්‍යස්ථානයකින් ඉරිදා, සදුදා සහ රජයේ නිවාඩු දිනවල හැර උදේ 9.00 සිට සවස 3.00 වන තෙක්.

වැඩිදුර විස්තර සඳහා www.ou.ac.lk/home වෙබ් අඩවියට පිවිස පාඨමාලා අත්පොත බලන්න.
මහජන තොරතුරු කාර්යාලය : 0112881256 /0112881327

ලේඛකාධිකාරී - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය